# පියවර දෙක



කතාව සහ නිර්මාණය: පූර්ණිමා මීගම්මන     චිත්‍ර: සුගප්‍රදා සෝමාස්කන්ද අයියර්

# ඩිජිටල් ආරක්ෂණය

## හැඳින්වීම

ජංගම දුරකථන, ටැබ්ලට් පරිගණක සහ පරිගණක වැනි ඕනෑම ඩිජිටල් පද්ධති සහිත උපාංගයක් භාවිතා කරන විට දී අපි, අපේ පෞද්ගලික තොරතුරු එයට ඇතුළත් කරන්නෙමු. නමුත් එම තොරතුරු අප පවුලේ සංවේදී දත්ත හෝ අපගේ සේවා ස්ථාන වල ඇති ඉතා වැදගත් දත්ත විය හැක. මෙම දත්ත වලට පින්තූර සහ වීඩියෝ වැනි නිර්මාණාත්මක දේවල් ද ඇතුළත් වේ.

අපේ දත්ත සහ උපාංග (ඩිජිටල් ලෝකයට ප්‍රවේශ වීමට භාවිතා කරන ජංගම දුරකථන, ලැප්ටොප් ආදිය) ආරක්ෂා කරගැනීම ඉතා වැදගත් වන අතර, අන්‍යයන්ගේ දත්ත සහ උපාංගවල ආරක්ෂාව ගැන ද සැලකිලිමත් විය යුතුයි. අන්තර්ජාලය යනු අප සැවොම එකිනෙකා හා සම්බන්ධ වන ස්ථානයක් නිසා, එක් අයෙකුගේ ආරක්ෂාව දුර්වල වුවහොත් එය සෑම කෙනෙකුටම බලපෑමට ඇති හැකියාව ඉහළ බැවින්, සියල්ලන්ම තමන්ගේ ආරක්ෂාව උපරිම මට්ටමකින් පවත්වාගැනීමට වගබලාගත යුතුය.

ඩිජිටල් ආරක්ෂණය සහ සයිබර් ආරක්ෂණය යනු සංකීර්ණ හෝ දුෂ්කර ආරක්ෂක පද්ධති නොවේ. ප්‍රශ්නයක් පැනනැගුණ අවස්ථාවල දී සමහර විට ඊට ඇති හොඳම විසඳුම තාක්ෂණික බවින් අවම සහ ඉතා සරල විය හැක. එසේම අන්තර්ජාලය ආශ්‍රිතව අපගේ ආරක්ෂාවට එල්ල වන තර්ජනවලින් ආරක්ෂා වීමට තරම් අපගේ ආරක්ෂක පද්ධති ඉහළ තත්වයකින් පවත්වාගත යුතුය.


පුතේ.. මම අම්මා,
අරින්න දොර..
ටොක්
ටොක්
මේ
එනෝ!


හා හා හා
මේක මගේ
ගෙදර දැන්.


ඊළඟ දවස...
ටොක්
ටොක්
පුතේ.. මම අම්මා, අරින්න දොර.
අම්මා?.. අද එනවා කිව්වෙ නැනෙ.
බලන්න ඕනෙ කවුද කියල.
බුදුඅම්මෝ!


හොඳ වෙලාවට මම බැලුවෙ. මේ අර වෘක තඩියනෙ.
ඉන්නකෝ හොඳ පාඩමක් උගන්නම් මම.
ක්ලික්!
අයියෝ
පුංචි ඌරු පැටියාගේ ගෙදර අමතර ආරක්ෂණයක් තිබුනා.
ටූ ස්ටෙප් ඔතෙන්ටිකේශන් යනු ඔබේ මුර පදය හැරුනු විට තවත් ආරක්ෂණයක් ඔබේ ගිනුමට භාවිත කිරීමයි.
සාමාන්‍යයෙන් එය ඔබගේ පිවිසුම නැවත තහවුරු කිරීම සඳහා ඔබගේ දුරකථනයට එවන කේතයකි.
ටූ ස්ටෙප් ඔතෙන්ටිකේශන් ආරක්ෂාව සඳහා වඩා හොඳයි.


ඒ වගේම ලේසියෙන් අනුමාන කල නොහැකි ශක්තිමත් මුරපද භාවිතා කරන්න.
මට කළ හැකි වෙන දේවල් මොනවාද?
• සමාජ ජාලා වෙබ් අඩවි වල ආරක්ෂක සැකසුම් යාවත්කාලීන කිරීම.
• අන්තර්ජාලයේ පෞද්ගලික තොරතුරු ඇතුලත් කිරීමේදී ප්‍රවේසම් වීම.
• ඔබගේ උපාංගවලට හානිදායක දේ බාගත විය හැකි අනාරක්ෂිත වෙබ් අඩවි වලින් ඈත් වී සිටින්න.
• ඔබගේ ප්‍රති - වයිරස මෘදුකාංග නිතර යාවත්කාලීන කරන්න.
• අනාරක්ෂිත බාගත කිරීම් වලින් වැලකී සිටින්න.

# උගත් පාඩම්

- අපගේ ගිණුම් ආරක්ෂා කරගැනීම සඳහා සවිමත් මුරපද භාවිතා කිරීම අතිශයින්ම වැදගත් වේ.

- දෙපියවර සත්‍යාපනය භාවිතා කරන්න (two-factor authentication)
ඔබ යොදන ප්‍රධාන මුරපදයට අමතරව, තවත් කේතයක් ඔබගේ ජංගම දුරකතයට හෝ ඔබගේ විද්‍යුත් තැපෑලට (E-mail) ලැබීමට සැලැස්වීමෙන් ඔබගේ ගිණුම්වල ආරක්ෂාව තවත් තර කරගත හැක.

- Facebook, Instagram වැනි සමාජ ජාල ගිණුම්වල ආරක්ෂක සැකසුම් යාවත්කාලීන කිරීම, එම ගිණුම් ආරක්ෂිතව පවත්වාගැනීම සඳහා වැදගත් වේ.

- අන්තර්ජාලයේ සැරිසරන විට පෞද්ගලික දත්ත හුවමාරු කරගැනීමේ දී පරිස්සම් විය යුතුයි.

- ඔබේ උපාංගවලට හානිකර විය හැකි වෙබ් අඩවිවලට ප්‍රවේශ නොවන්න.

- නොදන්නා වෙබ් අඩවි වලින් මෘදුකාංග බාගත කිරීමෙන් වළකින්න.සෑමවිටම වයිරස් ආරක්ෂණ මෘදුකාංගයක් භාවිතා කරන්න, එය නිතරම යාවත්කාලීන කරන්න.